# සතියේ සාකච්ඡාව

## සමාජය හා සාමයික කේන්ද්‍රයේ මාධ්‍ය ඒකකය

CSR
සමාජය හා සාමයික කේන්ද්‍රය
சமய சமூக நடுநிலையம்
Centre for Society & Religion


# යහපාලනය IMF පාලනයක් වීමට ඉඩ නොදමු!!




ප්‍රභාත් ලංකාලෝක විසිනි

2016 මාර්තු 21

අගමැති රනිල් වික්‍රමසිංහ මහතා විසින් පසුගිය මාර්තු 8 දින පාර්ලිමේන්තුවේදී "ශ්‍රී ලංකා ආර්ථිකයේ සැබෑ තත්ත්වය" මැයෙන් විශේෂ ප්‍රකාශයක් කරමින් 2016 අය-වැයෙන් ඉදිරිපත් කර තිබූ බදු ප්‍රතිපත්තිය යළිත් සංශෝධනය කරන බව දන්වා සිටියේය. මෙය විමතිය දනවන ප්‍රකාශයකි. 2016 අයවැය පාර්ලිමේන්තුව තුළ තුන්වන වර කියවා සම්මත කරගනු ලැබුවේ 2015 දෙසැම්බර් 19 දිනය. එමඟින් යෝජනා කොට තිබූ ඇතැම් බදු ක්‍රියාත්මක කිරීම අරඹා හෝ නොතිබුණි. මක්නිසාද ලංකාවේ බදු වර්ෂය ආරම්භ වන්නේ අප්‍රේල් 1 සිට වන නිසාය. 2016 අයවැය සම්මත කොට මාස 2 ½ ක් ගත වෙත්ම එමඟින් යෝජනා කොට තිබූ බදු යළිත් සංශෝධනය කිරීම රජයේ නොහැකියාව හා අදක්ෂතාවය මොනවට පෙන්වන්නකි. අනෙක් අතට එය සිදුකළේ අයවැය ඉදිරිපත් කළ මුදල් ඇමතිවරයා විසින් නොවීමත් එම ප්‍රකාශය කරන අවස්ථාවේදී අවම වශයෙන් මුදල් ඇමතිවරයා පාර්ලිමේන්තුව තුළ හෝ නොසිටීමත් විශේෂය.

2015 ජනවාරි 8 ජනතාව විසින් මහින්ද පාලනය අවසන් කිරීමෙන් පසු බලයට පැමිණි මෛත්‍රී-රනිල් පාලනය විසින් තම වසරක පාලන කාලය තුළ 2015 ජනවාරි 29 ඉදිරිපත් කළ අතුරු අයවැයද ඇතුලත්ව අයවැය 2ක් ඉදිරිපත් කළ අතර අමතරව 2015 සැප්තැම්බර් 01 දින ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් පාර්ලිමේන්තුව විවෘත කරමින් පැවැත්වූ කතාවේදී හා 2015 නොවැම්බර් 05 දින අගමැති රනිල් වික්‍රමසිංහ මහතා පාර්ලිමේන්තුව අමතා ඉදිරිපත් කළ ප්‍රකාශයේදී රටේ ආර්ථික ප්‍රතිපත්තිය ගැන විශාල අවධානයක් යොමුකොට තිබුණි.

එහෙත් මාර්තු 8 දින රනිල් වික්‍රමසිංහ මහතා කියා සිටියේ "ආණ්ඩුව ඉතා බරපතල විදියට ණය වී තිබුණා. … 2016 වසරේ අයවැය ලේඛනය සකස් කරද්දිත් රටේ ණය පිළිබඳ සම්පූර්ණ තොරතුරු වාර්තා වී තිබුණේ නැහැ" යනුවෙනි. මේ අනුව අපට අසා සිටීමට සිදුවන්නේ වත්මන් පාලනය අයවැය දෙකක් හා රටේ ආර්ථිකයට අදාල ප්‍රධාන ප්‍රකාශයන් දෙකක් සිදුකළේ රටේ ණය ගැන හෝ නිසි දැනුමක් නොමැතිවද යන්නයි. ඉදිරියේදී තව කුමන දේ ගැන දැනීමකින් තොරව තීරණ ගත්තා යයි මෙම පාලකයින් කියාවිදැයි යන සැකයෙන් කටයුතු කිරීමට ජනතාවට සිදුව ඇත.

අනෙක් අතට අයවැය යනු පාර්ලිමේන්තුව විසින් සම්මත කරන පනතකි. පාර්ලිමේන්තුව තුළ සති ගණනාවක් වාද විවාද කොට සම්මත කරනු ලබන පනතක අඩංගු කරුණු මෙයාකාරයට පාර්ලිමේන්තුව අමතා කරනු ලබන ප්‍රකාශයකින් වෙනස් කළ නොහැකිය. එසේ උත්සාහ ගැනීමම පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය කිරීමකි. මේ වනවිට රජය මුහුණ දී ඇති ගෙවුම් ශේෂ අර්බුදය සමනය කරගැනීම වෙනුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (IMF) ඇමරිකානු ඩොලර් බිලියන 1.5 ක ණයක් ඉල්ලා ඇත. නියත වශයෙන්ම IMF මෙවන් ණය මුදලක් ලබා දෙනුයේ කොන්දේසි මතය. ගෙවුම් ශේෂ අර්බුද සමනය කරගැනීමට සපයන ණය සම්බන්ධයෙන් IMF වෙබ් අඩවියේ "සාමාජික රටක් ණය ලබා ගැනීමට පෙර, රටේ බලධාරීන් ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වන වැඩපිළිවෙළකට IMF සමඟ එකඟ විය යුතුය. ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් රටක ඇති කැපවීම IMF ණය ලබාදීමේ අවියෝජනීය කොටසකි" යනුවෙන් දක්වා තිබීමෙන්ම ඒ බව මොනවට තහවුරු වේ.

IMF වෙතින් ශ්‍රී ලංකාව විසින් 2012 මහින්ද පාලන කාලය තුළ ලබාගත් ඩොලර් බිලියන 2.6 ණය පිළිබඳව 2015 දෙසැම්බර් 9 දින ඉදිරිපත් කළ සිව්වැනි පසුවිපරමේදී (Post-Program Monitoring - PPM) IMF ලංකාවේ බලධාරීන්ගෙන් බලාපොරොත්තුවන ආර්ථික ප්‍රතිපත්ති මොනවාදැයි දක්වා තිබුණි. ඒ "බලධාරීන් විසින් සාර්ව ආර්ථික ස්ථායීතාවය ආරක්ෂා කිරීමටත් කල් පවත්නා සහ සමස්ත වර්ධනයක් සඳහා පදනම දැමීමටත් අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය. ව්‍යාපාරික පරිසරය වැඩිදියුණු කිරීම, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය, සහ වඩා විවෘත වෙළඳපොළ තත්ත්වයන් තරගකාරිත්වය වර්ධනය කිරීමටත් ඉහල දැමීමටත් හේතු වේ" ලෙසිනි. ඔවුන් ඉල්ලා සිටින දෙය පැහැදිලිය. ව්‍යාපාරික පරිසරය වැඩිදියුණු කිරීම යන්නෙන් මොවුන් අදහස් කරන්නේ ව්‍යාපාරිකයන්ට රිසි සේ ආයෝජනය කිරීමටත්, ශ්‍රමය කොල්ලකෑමටත්, ලාභ රටින් බැහැර කිරීමටත් අවශ්‍ය පරිසරය සකස් කිරීමයි. විදුලිබල මණ්ඩලය, තෙල් සංස්ථාව, වරාය, ගුවන් සමාගම වැනි ආයතනය පුද්ගලීකරණය කිරීම හා එම කටයුතු වලින් රජය ඉවත්වීම රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය යන්නට දිය හැකි අර්ථයයි.

ලංකාවේ ආර්ථික තත්ත්වය පිළිබඳව සොයාබැලීම සඳහා 2016 පෙබරවාරි 1සිට 5 දක්වා ලංකාවේ සංචාරය කළ IMF කාර්‍ය මණ්ඩලයේ සංචාරය අවසානයේ IMF නිකුත්කළ පුවත්පත් නිවේදනයේ මෙසේ දක්වා තිබුණි. "සර්ව ආර්ථික ප්‍රතිපත්ති වඩාත් තිරසර මඟකට ගැනීම වෙනුවෙන් මේ වනවිටත් පියවර කිහිපයක් ගෙන ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව 2015දී විනිමය අනුපාතික තීරණය කිරීමේදී වෙළඳපොළ බලවේගවලට විශාල කාර්‍ය භාරයක් කිරීමට ඉඩ හැර ඇත. ඒ සමගම රුපියල 9%කට වඩා අවප්‍රමාණය විය... ඉතාම ඉක්මණින් මූල්‍ය හිඟය අඩුකරගනිමින් රාජ්‍ය පිරිවැය චිරස්ථායී මාවතකට ගෙනෙන ලෙසට (IMF) කණ්ඩායම රජයට උපදෙස් දෙයි. (ඇතැම් විශේෂ කාර්ය බදු කිහිපයක් ඉවත් කිරීම, බද්දෙන් නිදහස් කිරීම් ඉවත්කිරීම හා බදු පරිපාලනය සවිමත් කිරීමට කැපවීම වැනි) අයවැයෙන් ගනුලැබූ පියවරයන් අගය කරමින් දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළවලින් ණය ගැනීමට මඟ පාදන විශාල මූල්‍ය හිඟයන් මඟින් මතුකරන සර්ව ආර්ථික හා මූල්‍ය අවදානම් කෙරේ (IMF) කණ්ඩායම අවධානය යොමුකරයි. කණ්ඩායම බලධාරීන්ගෙන් ඉල්ලා සිටියේ බදු පදනම පුළුල් කිරීම, බදු ක්‍රම සරල හා සාධාරණ අන්දමට සකස් කිරීම හා බදු පරිපාලනය වැඩිදියුණු කිරීම, ණය පිළිබඳ වඩාත් ඒකාබද්ධ වාර්තාවක් තබාගැනීම හා ණය අඩුකිරීම යන කරුණුවලට වඩාත් නැඹුරු වෙමින් 2016 අයවැය පරතරය අඩු කරමින් ආයෝජනයට හා වර්ධනයට හිතකර ප්‍රවේශයකට යොමුවන ලෙසයි."

IMFහි මෙම ප්‍රකාශයන් එකට ගත්කල රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රකාශයේ අරමුණ පැහැදිලිය. රජය IMF වෙතින් ඉල්ලා ඇති ණය ලබාගැනීමට නම් ලංකාව IMF සමඟ එකඟ වූ ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වන රජයේ කැපවීම පෙන්විය යුතුය. ඒ වෙනුවෙන් පෙබරවාරි 1සිට 5 දක්වා ලංකාවේ සංචාරය කළ IMF කාර්‍ය මණ්ඩලයේ නිර්දේශයන් තමන් හිස් මුදුණින් පිළිගත් බවත් ඒ අනුව කටයුතු කරන බවත් පෙන්විය යුතුය. රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රකාශයේ අරමුණ වී ඇත්තේ එයයි.

රනිල් වික්‍රමසිංහ මහතා තම ප්‍රකාශය තුළ ලංකාව ලබාගෙන ඇති ණය සම්බන්ධයෙන් කළ සෝෂාවද IMF නිර්දේශයන් අනුවම කළ එකකි. ණය පිළිබඳ වඩාත් ඒකාබද්ධ වාර්තාවක් තබාගැනීමට IMF කළ නිර්දේශයන් අනුව යමින් මේ වනවිට විදුලිබල මණ්ඩලය, තෙල් සංස්ථාව, වරාය, ගුවන් සමාගම ආදී රාජ්‍ය ව්‍යවසායන් ලබාගෙන ඇති ණයද එකතුකොට ලංකාවේ ණය ගණන් හිලව් පාර්ලිමේතුවට ඉදිරිපත් කළේය. ඉන් නොනැවතී ණය පිළිබඳ විගණනයක් (Forensic Audit) කිරීමට IMF වෙතින් සහාය ඉල්ලා ඇතැයි ඔහු කියා සිටියේය. මෙම ණය පිළිබඳ විගණනය අවශ්‍ය වන්නේ IMF නිර්දේශයම අනුව ඒකාබද්ධ වාර්තාවක් තබාගැනීම සඳහා බව පැහැදිලිය. මෙය IMF නිර්දේශ කළ දේ ක්‍රියාවට නැඟීම ඔවුන්ටම පවරාදීමකි. තක්කඩි සොරෙකු සොරකමට ඉඩ ලබා ගැනීම සඳහා ගේට්ටුව වෙනස් කළොත් හොඳ බව ගෙහිමියාට යෝජනා කළ විට ඔන්න ඔය කියන විදියෙ ගේට්ටුවක් හයි කරල පලයන් යයි සොරාටම කියන මෝඩ ගෙහිමියෙකුගේ චරිතය අගමැති රනිල් වික්‍රමසිංහ මහතා විසින් රඟපා ඇත. මෙයාකාරයටම "බදු ක්‍රම සරල හා සාධාරණ අන්දමට සකස් කිරීම හා බදු පරිපාලනය වැඩිදියුණු කිරීම" වෙනුවෙන් IMF නිර්දේශ කරන විට "නව බදු ක්‍රමයක් සහ වැඩිදියුණු කළ ආදායම් රැස්කර ගැනීමේ ක්‍රමවේදයක් 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍යයි. මේ ගැන අප දැනටමත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා ආරම්භ කර තිබෙනවා" යනුවෙන් රනිල් වික්‍රමසිංහ මහතා කියා සිටී. රිලවා නටන්නේ රිලවාගේම වුවමනාවට නොවන බවට රනිල් වික්‍රමසිංහ මහතා විසින්ම මෑතදී ප්‍රකාශ කොට තිබුණි.

මාධ්‍ය වාර්තාවලට අනුව මාර්තු 8 ප්‍රකාශයට කලින් මාර්තු 2දා, මුදල් අමාත්‍ය රවී කරුණානායක මහතා විසින් රජයේ ප්‍රකාශයට පදනම් විය යුතු ලියවිල්ලක් සතිපතා පැවැත්වෙන ඇමතිවරුන්ගේ කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. එහිදී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් එහි වචන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වචනවලට සමාන බවත් එමගින් විපක්ෂයට ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පදයට නටන බවට චෝදනා කිරීමට අවස්ථාවක් ලැබෙන බවත් කියමින් එය විවේචනය කොට ඇත. මාධ්‍ය වාර්තාවලට අනුව මෛත්‍රීපාල සිරිසේන මහතා ලේඛනයේ පිටපත් ආපසු එකතු කරගන්නා ලෙසත් ඇමතිවරුන්ට එහි අන්තර්ගතය හෙළි නොකරන ලෙසත් කියා ඇත. මාර්තු මස 4 වන දින, වික්‍රමසිංහ මහතා විසින් එම යෝජනාම "ශ්‍රී ලංකා ආර්ථිකයට ගෝලීය ආර්ථික පසුබෑමෙන් වන බලපෑම් අවම කිරීම" නම් වූ පිටු නවයක ලියවිල්ලකට ගොනුකොට කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර ඇති අතර එයට කැබිනට් අනුමැතිය ලැබී ඇත. අඳෝමැයි !!! මෛත්‍රීපාල සිරිසේන මහතාගේ විරෝධය තිබී ඇත්තේ ලියවිල්ලේ අන්තර්ගතයට නොව එය ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පදයට නටන බව විපක්ෂයට පෙනී යන ආකාරයෙන් ලියා තිබීම ගැනය.

රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රකාශය මගින් සංසථාපිත හා සංස්ථාපිත නොවන බදු සම්බන්ධ 2016 අයවැය යෝජනා වසරකට අත්හිටුවීමටත්, 2016 අයවැයෙන් යෝජනා කළ ව්‍යවස්ථාපිත ආදායම සඳහා වන බද්ද 15% සිට 17.5% දක්වා වැඩි කිරීමටත්, ප්‍රාග්ධන ඉපයීම මත වන බද්ද යළි පැනවීමටත්, ජාතිය ගොඩනැඟීමේ බද්ද 2% මට්ටමේම පවත්වා ගනිමින් බද්දට යටත්වන ආදායම මිලියන 3.75 සිට මිලියන 3 දක්වා පහත දමමින් එම බද්දට යටත්වන ප්‍රමාණය ඉහළ දැමීමටත්, 11% ලෙසින් තනි අනුපාතයක්ව තිබී 2016 අයවැය මගින් 8%ක් හා 12%ක් ලෙස අනුපාත දෙකක් ලෙස පවත්වා ගැනීමට යෝජනා කොට තිබූ වැට් බද්ද 15%ක් දක්වා ඉහළ දැමීමටත් යෝජනා කොට ඇත.

වැට් බද්ද ඉහළ දැමීම ජනතාවට එදිනෙදා අවශ්‍ය සියළුම භාණ්ඩ හා සේවාවල මිල බරපතල ලෙසින් වැඩිකර දැමීමට හේතුවනු ඇත. ජාතිය ගොඩනැඟීමේ බද්ද ව්‍යවසායන් විසින් ගෙවිය යුතු වුවත් එය අවසාන වශයෙන් පැටවෙන්නේ පාරිභෝගිකයින් වන ජනතාව මතටමය. කුමන තත්ත්වයක් මත හෝ රනිල් වික්‍රමසිංහ මහතා දක්වා සිටි පියවර කම්කරුවන් හා දුගී ජනයා කෙරේ ඉතා අහිතකර අන්දමින් බලපාන බව පැහැදිලිය. දැනටමත් තිරිඟු පිටි මිල ඉහළ ගොස් පාන් මිළ අවම ලෙසින් රු.7/-කින් වැඩිවී ඇත. රනිල් වික්‍රමසිංහ මහතා කියා සිටින්නේ මෙකී පියවර මඟින් අයවැය පරතරය දළ දේශීය නිශ්පාදිතයෙන් 5.9% සිට 5.4% දක්වා පහළ දැමිය හැකි බවයි. අයවැය පරතරය 0.5%කින් අඩුකිරීම වෙනුවෙන් ජනතාවට ගෙවීමට සිදුව ඇති වන්දිය අති මහත්ය.




ජනතාවට කුමන වන්දියක් ගෙවීමට සිදු වුවත් IMF විසින් කියා තිබූ කරුණු සියල්ල වත්මන් රජය එලෙසින්ම ඉටු කරන බව පෙන්වා ඇත. 1990 සිට පසුගිය 25 වසර තුළ රටේ දළ දේශීය නිශ්පාදිතයට සාපේක්ෂව අයවැය පරතරය 6%ට අඩුවූයේ 2013දී එනම් IMF විසින් 2012 අවසන් ණය ලබාදීමෙන් පසු එළැඹි පළමු මුදල් වසර තුළ පමණි. 2011දී 6.9ක්, 2012දී 6.5ක් ලෙසින් පැවති අයවැය පරතරය 2013දී 5.9ක් දක්වා අඩුවිය. මහින්ද පාලනයද IMF උපදෙස් අනුව කටයුතු කළ ආකාරය ඉන් පැහැදිලිය. එහෙත් 2014දී නැවත එය 6% දක්වා ඉහළ ගියේය.

වත්මන් ආණ්ඩුව ආරම්භයේ සිටම IMFට වුවමනා ලෙස අයවැය පරතරය අඩුකිරීමට කටයුතු කළේය. 2015 ඔක්තෝම්බර් 20 දින Lanka Business Onlineහි පළවූයේ 2015දී පරතරය 4.4%ක් කරගැනීම වෙනුවෙන් අයවැය සකස්කළත් එය 6.8%ක් පමණ දක්වා වැඩිවනු ඇති බව මුදල් ඇමති රවී කරුණානායක මහතා කියාසිටි බවයි. මොවුන් අයවැය පරතරය 4.4% දක්වා අඩුකර ගැනීමට ගත් ප්‍රධානම පියවර නම් ජනතා විරෝධී අන්දමින් සහනාධාර කප්පාදු කිරීමයි. සහනාධාර කප්පාදු කිරීමේ පළමු පියවර වූයේ ඒවාට මිලක් නියම කිරීමයි. පාසැල් නිල ඇඳුම් සඳහා කූපන් දීම මඟින් එයට මිලක් නියම කර ඇත. පොහොර සහනාධාරයට සිදු කරනු ලැබුවේද එයමය. එසේ නියම කරන වටිනාකම් වෙනස් නොවන නමුත් අදාල භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යයි. මෙසේ වසර ගණනාවක් ගතවන විට එකී සහනාධාර ඉබේටම බරපතල ලෙස කප්පාදුවී හමාරය. අද ගොවි ජනතාවට පොහොර සහනාධාරය කලින් තිබූ ආකාරයට ලබාදෙන ලෙස ඉල්ලා පාරට බැසීමට සිදුව ඇත්තේ මේ නිසාය. රජය ලබාදෙන මුදලින් අවශ්‍ය පොහොර ප්‍රමාණය කිසිසේත් මිලට ගත නොහැකි බව රජයටම පිළි ගැනීමට සිදුව ඇත.

පසුගිය වසරක කාලය තුළ රුපියල 9%කට වැඩියෙන් අවප්‍රමාණය කිරීමද IMF නිර්දේශයන්ට ගැලපෙන බව IMF විසින් එය අගය කර තිබීමෙන්ම පෙනී යයි. මෙම අවප්‍රමාණය කිරීම නිසා 2015 දෙසැම්බර්වලින් අවසන් වූ මාස 10තුළ ලංකාවේ අපනයන වටිනාකම දරුණු අන්දමට 18.7%කින් පහළ වැටුණි. ලංකාවේ අපනයනවලින් 50%ක් පමණ වන ඇඟලුම් අපනයනවල වටිනාකම් දෙසැම්බරයේදී 12.8%කින් පහත වැටී තිබුණි. එය ඇඟලුම් අපනයනවල වටිනාකම එකදිගට පහළ වැටුණු තුන්වන මාසයයි. ලංකාවේ දෙවන විශාලතම අපනයනය වන තේ අපනයන වටිනාකම දෙසැම්බරයේදී කලින් වසරේ දෙසැම්බරයට සාපේක්ෂව 25%කින් පහළ වැටී තිබුණි. ලෝක වෙළඳපොලේ තෙල් මිල පහත වැටුණු තත්ත්වය තුළත් 2015 ලංකාවේ වෙළෙඳ ශේෂය ඩොලර් බිලියන 8කට අධික බවට ඇස්තමේන්තු කොට ඇත. අනෙක් අතට රුපියල අවප්‍රමාණය කිරීම නිසා විශේෂයෙන් මැද පෙරදිග වැනි රටවල සිට විදේශ සේවා නියුක්තිකයන්ගෙන් රටට ලැබෙන මුදල්වල වටිනාකම පහත වැටෙමින් තිබේ. එය 2014දී ඩොලර් බිලියන 7 සිට, 2015 දී ඩොලර් බිලියන 6.9 දක්වා පහත වැටී ඇත. "සර්ව ආර්ථික ප්‍රතිපත්ති වඩාත් තිරසර මඟකට ගැනීම වෙනුවෙන්" ගනු ලැබූ පියවරක් ලෙසින් IMF ඇගයීමට ලක්කළ රුපියල අවප්‍රමාණය කිරීමේ සැබෑ ප්‍රතිඵලය එයයි.

2015 නොවැම්බර් 05 දින අගමැති රනිල් වික්‍රමසිංහ මහතා මධ්‍ය කාලීන ආර්ථික ප්‍රතිපත්තිය ඉදිරිපත් කරමින් කියා සිටියේ 2020 වන විට අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් 3.5% දක්වා අඩුකරලීමට කටයුතු කරන බවයි. ඒ වෙනුවෙන් දිගින් දිගටම රාජ්‍ය වියදම් කප්පාදු කිරීමට රජයට සිදුවනු ඇත. ජනතාවට ලබාදෙන සහනාධාර තව තවත් කප්පාදු කිරීමට රජය පියවර ගනු නිසැකය. අනෙක් අතට රාජ්‍ය ආදායම් වැඩිකර ගැනීම සඳහා ජනතාවගෙන් තව තවත් බදු අයකර ගැනීමට රජයට සිදුවනු ඇත. අයවැය හිඟය 0.5%කින් අඩුකිරීම සඳහා ආණ්ඩුව කරන ලද බදු සංශෝධන යෝජනා මෙසේ නම් එය තවත් 2%කින් පමණ එනම් 4 ගුණයකින් අඩු කිරීමට යාමේදී ජනතාවට දැරීමට වන බර කෙසේදැයි අපට සිතාගත හැකිය.

ජනතාව මත බදු පටවමින් සනාධාර කප්පාදු කරමින් සිටින මෙම රජය විදේශ ජාවාරම්කරුවන්ට ලංකාව පාරාදීසියක් කිරීමට සියළු පියවර ගනිමින් සිටී. පසුගිය ජනාරි 26 සිට 30 දක්වා ස්විට්සර්ලන්තයේ ඩාවෝස් නුවර පැවති ලෝක ආර්ථික සමුළුවට අගමැති රනිල් වික්‍රමසිංහ මහතා සහභාගි විය. ලෝක ආර්ථික සමුළුව යනු එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් හෝ රජයන් අතර එකඟත්වයකින් හෝ පිහිටුවා ගත් සමුළුවක් නොව ලෝකයේ සිටින ඉහළම ව්‍යාපාරිකයන් විසින් ඇති කළ එකකි. එයට සහභාගි වෙමින් රනිල් වික්‍රමසිංහ මහතා විසින් "2030 වසර වන විට ශ්‍රී ලංකාවේ ආර්ථික සිතියම නිර්මාණය කිරීමේ කාර්ය භාරය සැබැවින්ම ආයෝජකයන් වෙත පැවැරෙන බවත්, ඒ දීප්තිමත් සිතියම නිර්මාණය කිරීම සඳහා සියලු පහසුකම් රජය විසින් සැපයෙන බවත්" කියූ බව 2016.02.07 සිළුමිණ පුවත්පත වාර්තාකොට තිබුණි. ඒ අනුව ලංකාවේ ආර්ථික සිතියම නිර්මාණය කරන්නේ රජය නොව ජාවාරම්කාර ආයෝජකයින්ය. රජය ඒ වෙනුවෙන් සියළු පහසුකම් සැළසීමට සපථ කර ඇත. සිළුමිණ පුවත්පත් වාර්තාව තව දුරටත් කියා තිබුණේ "මේ ආර්ථික සමුළුව අතරතුර අන්තර්ජාතික වශයෙන් නමක් දිනූ මහ පරිමාණ වෙළෙඳ සමාගම් ප්‍රධානීන් සමඟද ශ්‍රී ලංකාවේ ඉදිරි ආයෝජන කටයුතු සම්බන්ධව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා හා සාකච්ඡා පැවැත්වූ" බවත් "වර්ජිනියා ව්‍යාපාර සමූහයේ ප්‍රධාන විධායක රිචඩ් බ්‍රැන්සන්, නෙදර්ලන්තයේ පිලිප් ලයිටින් සොලූෂන් සමාගමේ ජගත් ප්‍රධාන විධායක නිලධාරී එරික් රොන්ඩෝල්ට්, ටාටා සමාගමේ ප්‍රධානී සයිරස් මිස්ට්‍රි, මැක්කින්සි සහ සමාගමේ ආසියානු කලාපයේ සභාපති කෙවින් ස්නීඩර්, බහරේන් පෙට්‍රෝලියම් සමාගමේ ගෞරවනීය සභාපති හා එරට අගමැති උපදේශක ෂෙයික් සල්මාන් බින් කලීෆා අල් කලීෆා, ලෝක ප්‍රකට මයික්‍රොසොෆ්ට් සමාගමේ සභාපති ජෝන් ෆිලිප් කෝට්ෂ් යන මහත්වරු ඒ අතර වූ" බවත්ය. රනිල් වික්‍රමසිංහ මහතා සියළු පහසුකම් සැපයීමට සපථ කරන්නේ ලෝකයේ තිබෙන මෙම සුපිරි සමාගම්වලටය.

ලෝක ආර්ථික සමුළුවට කලින් ජනවාරි 7 හා 8 දිනවල ආන්ඩුව විසින් කොළඹදී 'ශ්‍රී ලංකා ආර්ථික සමුළුව' සංවිධානය කර තිබූ අතර එයට ඇමරිකානු ප්‍රකෝටිපති ජෝර්ජ් සොරෝස් හා ලෝක බැංකුවේ හිටපු ප්‍රධානී ජෝෂප් ස්ටිග්ලිස්ට් ඇතුලු ජාත්‍යන්තර ආයෝජකයන්ටද ආරාධනය කොට තිබුණි. ජෝර්ජ් සෝරෝස් යනු මූල්‍ය වෙළඳපොල තුළ කුප්‍රකට චරිතයකි. බ්‍රිතාන්‍යය තුළ කළු බදාදා නමින් හඳුන්වන බ්‍රිතාන්‍යයට පවුම් බිලියන 4.3ක අලාභයක් ඇතිකළ 1992 සැප්තැම්බර් 16 මූල්‍ය අර්බුදය ඇති කරනු ලැබුවේ සොරෝස්ගේ මූල්‍ය වෙළඳපොල ක්‍රියාවන් විසිනි. එම අර්බුදය ඇතිකිරීමෙන් සෝරෝස් ලැබූ ලාභය ඩොලර් බිලියනයකට වැඩි බවට ඇස්තමේන්තු කොට ඇත. එපමණක් නොව 1997 ආසියානු මූල්‍ය වෙළඳපොල බිඳවැටීම පසුපස සොරෝස් සිටින බවට එවක ඉන්දුනීසියානු අගමැති මහතීර් මොහොමඩ් විසින් විවෘතවම චෝදනා කළේය. 'ශ්‍රී ලංකා ආර්ථික සමුළුව' ප්‍රධාන ආරාධිතයෙකු වශයෙන් ගෙන්වා තිබුණේ තම අධි ලාභ වෙනුවෙන් සමස්ත කලාපයක මූල්‍ය වෙළඳපොල කඩාවැටීමට සැළැස්වූ මෙවන් ජාවාරම්කාරයෙකි.

එම සමුළුව අමතමින් රනිල් වික්‍රමසිංහ මහතා කියා තිබුණේ ශ්‍රී ලංකාව ‘දකුණු ආසියාවේ වඩාත්ම තරඟකාරී රාජ්‍යය’ බවට පරිවර්තනය කර, එය සිංගප්පූරුව හා ඩුබායි අතරේ පවතින, දැවැන්ත නගරයක් ලෙස ගොඩනැගීම ආණ්ඩුවේ වුවමනාව බවය. මෙය 2015 දෙසැම්බර් 9 දින IMF ඉදිරිපත් කළ සිව්වැනි පසුවිපරමේදී (PPM) තරඟකාරිත්වය වර්ධනය කිරීම ගැන කළ නිර්දේශය රනිල් වික්‍රමසිංහ මහතා විසින් ඒ හැටියෙන්ම දෙසා වැදෑරීමකි.

එම සමුළුවේදී “ඔබට ඉතා දුෂ්කර තත්ත්වයන්ට මුහුන දීමට සිදුවන නිසා මාහට  නරක ආරංචියක්  ගෙනෙන පණිවිඩකරුවෙක් වීමට සිදුවේ යැයි බියක් දැනෙනවා” යනුවෙන් සෝරෝස් කියා තිබුණි. චීනය ගැන සඳහන් කරමින්, චීනය “ලෝකයේ අනෙකුත් රටවල් අස්ථාවර කරන බව” කියා සිටි ඔහු “මුදල් තව දුරටත් සංවර්ධනය වන රටවලට නොපැමිනෙන බවත් තත්ත්වය හොඳ අතට හැරෙන තුරු බලා නොසිට අම්හිරි තෝරාගැනීම් සඳහා සූදානම් විය විය යුතු” බවද කියා සිටියේය. රනිල් වික්‍රමසිංහ මහතා මාර්තු 8 දින පාර්ලිමේන්තුවේදී කළ ප්‍රකාශය තුළද එම අන්තර්ගතයම අඩංගු වී තිබුණි. රජය නටන්නේ කාගේ පදයටදැයි සක් සුදක් සේ පැහැදිලිය.

මේ සියළු තත්ත්වයන් මැදත් නිල නිවාස නොමැති මන්ත්‍රීවරයෙකුට මසකට රුපියල් 50,000ක මුදලක් සහ කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා රුපියල් 75,000ක මුදලක් වෙන් කරමින් මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද දීමනා ඉහළ දැමීම කුමනම හෝ යහපාලන මූලධර්මයක් හා නොගැලපෙන්නකි. පාං ගෙඩිය රු.7/-කින් ඉහළ නංවා, පොහොර සහනාධාරය ඇතුළු සහනාධාර කප්පාදු කරමින්, වැට් බදු වැඩි කිරීම මඟින් සියළු භාණ්ඩ හා සේවාවල මිල වැඩිවීමට පසුබිම සකස් කොට, ලෝකයේ ඉහළම ධනපතියන්ට සියළු පහසුකම් දෙමින් මන්ත්‍රීවරුන්ගේ දීමනා ඉහළ දැමීමේ තුච්ඡ ආර්ථික ප්‍රතිපත්තිය සියළු සමාජ ක්‍රියාධරයන්  විසින් පිළිකුලෙන් යුතුව හෙළා දැකිය යුතුය. මෙම තත්ත්වයට විරුද්ධව සියළු ආකාරයේ ජනතා බලවේග පෙළ ගස්වමින් මෙම ජනතා ද්‍රෝහී ක්‍රියා කලාපය පරාජය කිරීමට සංවිධානය විය යුතුය. 2015 ජනවාරියේ හා අගෝස්තුවේ ඒකාධිපති මහින්දවාදී වියරුව පරාජය කළ ජනතාව හමුවේ ඇති මීළඟ අභියෝගය එයයි.

---

‘සාධාරණය’ සඟරාව කියවන්න